| පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව - සති පාසල | සැප්. 4 සතිය |
|---|---|
| විෂය - විද්‍යාව | |
| 9 ශ්‍රේණිය | සැකසුම - එම්.ජී.ඒ.වී.කේ. ධර්මරත්න. කලාප අධ්‍යාපන කාර්යාලය - නිවිතිගල. |
| කාලය - පැය 3 | |

Department of Education, Sabaragamuwa Province/ Weekly School

**<u>මාතෘකාව - සරල යන්ත්‍ර</u>**

**<u>පාඩම - යන්ත්‍ර</u>**

* මෙම අධ්‍යයනය අවසානයේදී ඔබ,

- යන්ත්‍රයක් යන්න පැහැදිලි කරයි.
- යන්ත්‍ර මගින් කාර්ය පහසු කෙරෙන උපක්‍රම දැක්වීමට නිදසුන් ඉදිරිපත් කරයි.
- ලීවරය, ආනත තලය, චක්‍රය හා අක්ෂ දණ්ඩ, කප්පිය යන මේවා සරල යන්ත්‍ර ලෙස භාවිතා කරන බව ප්‍රකාශ කරයි.

පළමුව 9 ශ්‍රේණිය පෙළ පොතෙහි ii කොටසෙහි පිටු අංක 84 කීපවරක් කියවන්න.ඒ අනුව,

1. 15.1 රූපය ආකාරයේ දල සටහනක් ඇඳ එය යටින් ඊට අදාල යන්ත්‍රයේ නම ලියන්න.
2. 15.2 රූපයේ පෙනෙන ලෙස 84 පිටුවේ තුන්වන ඡේදය අනුව ක්‍රියාකාරකම සිදු කරන්න.
   a. ලෝහ කැබැල්ල සිරස්ව එල්ලා තුලාවේ පාඨාංකය ලබා ගන්න. ඉන්පසු එය 15.2 රූපයේ ආකාරයට ලෑල්ලක තබා පාඨාංකය ලබා ගන්න. එම පාඨාංක වල වෙනස විමසා බලන්න.

- ඉන්පසු 85 පිටුව කීපවරක් කියවන්න.එහි 15.3 රූපය ආකාරයේ දල සටහනක් ඇඳ ඊට යටින් අදාල යන්ත්‍රයේ නම ලියන්න.
- එසේම 85 පිටුවේ දෙක,තුන ඡේද නැවත කියවා 15.4 රූපය අනුව දල සටහනක් ඇඳ ඊට අදාල යන්ත්‍රයේ නම යටින් ලියන්න.
- ඉන්පසුව හතරවන ඡේදය කියවා 15.5 රූපයේ ආකාරයට දල සටහනක් ඇඳ ඊට යටින් අදාල යන්ත්‍ර වර්ගය ලියන්න.

ඉන්පසු,

1. සරල යන්ත්‍ර යන්න නිර්වචනය කරන්න.
2. සරල යන්ත්‍ර 4 නම් කරන්න. එක් එක් යන්ත්‍රයන් සඳහා උදාහරණ දෙක බැගින් ලියන්න.
3. සරල යන්ත්‍ර හතර ලියා ඒවායේ ඉංග්‍රීසි නම් ලියන්න.

** අමතර දැනුම සඳහා, හැකිනම්,

- පුවත්පත් වල ඇති තොරතුරු රැස් කරන්න.